**සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදල - 2014**

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනතේ 58 ඒ වගන්තිය යටතේ පළකළ 1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 1(iii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තැගි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ට පටහැනිව මුදල් පදනම මත සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුහුණු පාසලේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී පළාත් සභාවක් වෙත ලබාදී තිබූ රු. 47,134,000 ක අත්තිකාරම් මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.39,984,096 ක් පමණක් වැයකර තිබූ අතර එය කෙරී ගෙන යන වැඩ ලෙස සහ ඉතිරි මුදල වන රු. 7,149,904 ක් අත්තිකාරම් ලෙස දැක්වීම වෙනුවට මුළු මුදලම ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) විශේෂ අවස්ථාවකදී හැර වියදමක් ආදායමට හිලව්කර නොදැක්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුල සමථ ගාස්තු ලැබීම් එම ගාස්තු ගෙවීම්වලට හිලව්කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.1,615,247 ක් වූ සමථ ගාස්තු දඩ මුදල් අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට භාණ්ඩාගාරයේ ආදායම් ශීර්ෂයට බැර කර තිබුණි.

**2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) <u>ව්‍යවස්ථාපිත විධිවිධාන</u><br>1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | දුම්කොළ බදු පනත යටතේ අය කරනු ලබන දඩ මුදලින් 1/4 ක් දුම්කොළ තැගි අරමුදලට මාරුකළ යුතු අතර, ඒ සඳහා පනතේ 17 (ii) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් යෝජනා කරන ක්‍රමයක් අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවතින තැගි අරමුදලක් ස්ථාපිත කර ගත යුතුය. එයට පටහැනිව දුම්කොළ දඩ මුදල් ලැබීම්, සුරාබදු තැගි අරමුදල යටතේ දුම්කොළ තැගි අරමුදලට ගෙවිය යුතු මුදල් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. |

(ආ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>

| | |
|---|---|
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | අරමුදල සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.63,375,039 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.44,957,705 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,417,334 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමථ ගාස්තු ලැබීම් ප්‍රමාණය රු.33,470,068 ක ප්‍රමාණයකින් වැඩි වී තිබීම මෙම අතිරික්තයේ වර්ධනයට මූලිකව බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 5,319 ක් මඟින් රු.163,101,331 ක ආදායමක් උපයා තිබූ අතර, ඉකුත් වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 6,420 ක් මඟින් රු.129,143,113 ක ආදායමක් උපයා තිබුණි. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්මික අපරාධ වැටලීම් ආදායම රු.33,958,218 ක් හෙවත් සියයට 26 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ආ) 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 4.5 වගන්තිය ප්‍රකාර නිර්ණීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් කටයුතුවලට සමාලෝචිත වර්ෂය සඳහා රු.200,000 ක් වෙන් කර තිබුණද, 2014 වර්ෂය තුළ වාර්තා වූ එවැනි ක්‍රියා සඳහා අරමුදලින් ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය අනුව පිහිටුවනු ලැබූ "සුරාබදු තෑගි" අරමුදලින් සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් සහ වෙනත් අයට තෑගි ගෙවීම් සහ නිර්ණීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් සඳහා සුදුසු නිළධාරීන් තෝරාගැනීම සඳහා වූ අනුමත ලිඛිත ක්‍රමවේද සකස් කළ යුතුව තිබුණද 2015 ජුලි 31 දින දක්වාම එවැනි ක්‍රමවේද පිළියෙල කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

5.1 **ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

**5.2 වත්කම් කළමනාකරණය**

ස්ථාවර වත්කම් වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය කරනු ලබන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ ක්ෂය සංචිත අරමුදලට බැර කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.14,123,123 ක් වූ ස්ථාවර වත්කම් මිලට ගැනීමේදී එම ක්ෂය සංචිත අරමුදල භාවිතා කිරීමකින් තොරව, සුරාබදු තැගි අරමුදලින් පමණක් ගෙවීම් කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් පාලනය